# ශ්‍රී ලාංකේය ආහාරපාන සංස්කෘතිය කෙරෙහි චීන ආහාරපාන සංස්කෘතියේ බලපෑම

*නිපුණ හේමින්ද බස්නායක, බී. ඒ.* [1]

සංස්කෘතිය යනු, '**සකස් කොට ගත් දෙය**' වශයෙන් සංක්ෂිප්ත අර්ථ කථනයක් කළ හැකිය. භාෂාව, ඇඳුම-පැළඳුම, ආගම, ගෘහ නිර්මාණ ශිල්පය ඈ සෑම අංශයක මෙන්ම ආහාරපාන විෂයෙහි ද සංස්කෘතියක් පවතී. කිසියම් ජන සමූහයක් සම්මත කොට ගත් සංස්කෘතික තත්ත්වයන් විවිධ ජන කොටස් අතර වෙනස් ස්වරූපයකින් ප්‍රචලිත වෙයි. ආහාරපාන සංස්කෘතියද රටින් රටට වෙනස් වන බව කිව හැකිය. විවිධ දේශාන්තරවල සමීප බැඳීම හේතුවෙන් මෑතකාලීනව ලංකා සංස්කෘතියට යම්බඳු බලපෑමක් ඇතිව තිබෙන බව අවිවාදිතය. මෙය ආහාර සංස්කෘතියටද අදාළ වූවකි.

මෙම පර්යේෂණයෙහි අභිප්‍රාය වන්නේ චීන ආහාරපාන සංස්කෘතිය ලංකාවේ ආහාරපාන සංස්කෘතිය කෙරෙහි කොතෙක් දුරට බලපාන්නේදැයි විමසා බැලීමය. වර්තමානයේ ලංකාවේ පවත්නා චීන අවන්හල් ප්‍රමාණය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගනී. මේ කාරණය, මෙම පර්යේෂණය කෙරෙහි යොමු වීමට හේතු පාදක විය. මෙහිදී ලංකාවේ ආහාරපාන සංස්කෘතිය කෙරෙහි චීන ආහාරපාන සංස්කෘතියෙන් කොතෙක් බලපෑම් ඇති වීද? යන්න සොයා බැලීම පර්යේෂණ ගැටලුවයි. ඍජු නිරීක්ෂණය පර්යේෂණයේ ප්‍රධානතම ක්‍රමවේදයයි. චීන අවන්හල් ගණනාවක් පර්යේෂණ කාර්යය සඳහා යොදා ගැනිණ. මීට අමතරව චීන ආහාරපාන සංස්කෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් කෘති කිහිපයක් උපයෝගී කර ගත් අතර, සඟරා හා පුවත්පත් පරිශීලන කාර්යයද සිදු විය. චීන ආහාරපාන සංස්කෘතියට අදාළ වූ ඇතැම් සිරිත්-විරිත් පිළිබඳ දැන ගැනීම සඳහා අන්තර්ජාලය අතිශයින් ප්‍රයෝජනවත් විය. මීට අමතරව මේ සම්බන්ධ දැනුමකින් හෙබි වියතුන් සමග කළ සාකච්ඡාද පර්යේෂණ ක්‍රියාවලියට භාවිත කෙරිණ. මෙම ක්‍රමවේදයට අනුව සිදු කළ පර්යේෂණයෙන් බොහෝ කරුණු අනාවරණය විය. එයින් පළමුවැන්න නම්, ලංකාවේ ආහාරපාන සංස්කෘතිය සමග බද්ධ වී තිබූ ආගන්තුක සත්කාර ක්‍රමයට යම් ආකාරයක විසාධනීය බලපෑමක් සිදු වී ඇති බවය. කාලයෙහි හා අවකාශයෙහි පවත්නා ඌනතාව හේතුවෙන් බොහෝ අවස්ථාවන්හිදී ලාංකේය මිනිසුන් චීන අවන්හල් කෙරෙහි යොමු වී තිබීම මීට බලපා තිබේ. ලංකාවේ ආහාරපාන සකස් කිරීමේදී (පිසීමේදී) යොදා ගැනුණු සාම්ප්‍රදායික ක්‍රමවේද ඉවත

ලා රසායනික හා කෘත්‍රිම රසකාරක වැනි දේ සඳහා පෙලඹීමේ ප්‍රවණතාවක්ද ඇති වී තිබේ. අත උපයෝගී කොට ගෙන ආහාර පරිභෝජනය කිරීමේ රටාව වෙනුවට 'කෝටු' භාවිතයටද (Chopsticks) ලංකාවේ මිනිසුන් හුරුව ඇති බව ඍජු නිරීක්ෂණයෙන් හෙළි විය. ලංකාවේ ආහාරපාන සංස්කෘතියෙහි මස්.මාංස අනුභව කළද ඒවායේ සදාචාරාත්මක පක්ෂයක් පිළිබිඹු වෙයි. එහෙත්, චීන ආහාරපාන සංස්කෘතියේ බලපෑමෙන් ඒවායේ සදාචාරාත්මක පක්ෂය හීන වී ඇති බව මාංශ වියළීමේ (Roast Chicken) ක්‍රම නගරවල මෙන් ම අර්ධ නගරවලද දක්නට ලැබීමෙන් විද්‍යමාන වෙයි. චීනයේ ආහාර අනුභවයේදී කෑම මේසයේ අසුන් ගන්නා සම්මත පිළිවෙළක් තිබේ. වැඩිහිටියන් ප්‍රමුඛත්වයෙහි ලා පවත්නා එම පටිපාටිය සදාචාරාත්මක ක්‍රමවේදයකි. එවැනි ක්‍රමවේදයකට අනුව මෑත කාලයේදී ලංකාවේ ඉදි වූ චීන අවන්හල්වල මේවා නිර්මාණය කර තිබීම සාධනීය බලපෑමක් වශයෙන් පෙන්වා දිය හැකිය. පර්යේෂණයෙන් ලැබුණු ප්‍රතිඵලවලට අනුව කරුණු සලකා බැලීමේදී ශ්‍රී ලංකාවේ ආහාරපාන සංස්කෘතිය කෙරෙහි චීන ආහාරපාන සංස්කෘතියෙහි පවත්නා ආහාර පරිභෝජන රටාව, ආහාර පිසීමේ ක්‍රමෝපායයන් සහ හරපද්ධතිය යනාදි වූ අංශයන්ගෙන් බලපෑම් ඇතිව තිබෙන බව කිව හැකිය. සමස්තයක් වශයෙන් ගත් කල ලාංකේය ආහාරපාන සංස්කෘතියට අනන්‍ය වූ සමාජ හර පද්ධතීන්ට හා සංස්කෘතික සංලක්ෂණයන්ට හිතකරව මෙන්ම අහිතකරව චීන ආහාරපාන සංස්කෘතිය බලපෑම් ඇති කරන බව විද්‍යමාන වෙයි.

**ප්‍රමුඛ පද :** සංස්කෘතිය, ආහාරපාන සංස්කෘතිය, ආහාරපාන, චීන අවන්හල්, චීන ආහාර

[1]*පශ්චාත් උපාධි අපේක්ෂක, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.* nipunaheminda90@gmail.com